කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2017/2019 සහ
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2017/2018

ප්‍රථම සෙමෙස්තරය

**MAS 601 – සමාජ විද්‍යා න්‍යාය**

**එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් හෝ තෝරාගෙන ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න**

***කාලය: පැ (03) තුනයි***

---

<u>පළමු කොටස</u>

1. 'වැටුප් ශ්‍රමය සදාචාරමය වශයෙන් හෙලා දැකීම යන්නෙහි පදනම වන්නේ අඩුවෙන් වැටුප් ගෙවීම නොව, වැටුප් ශ්‍රමය, එහි ස්වභාවයෙන්ම මිනිසා මානවත්වහරණයට (dehumanize) ලක් කිරීමයි'. කාර්මික ධනවාදයේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ කාල් මාක්ස්ගේ අදහස් ඇසුරෙන් මෙම ප්‍රකාශය විමසන්න.

2. 'මානව සමාජයේ සියලු ප්‍රගමන, ඉතිහාසයේ සුවිශේෂ අවස්ථාවන්හි මතු වූ 'තාර්කිකත්වයේ' පදනම මත ගොඩනැගී ඇත.' යන මැක්ස් වෙබර්ගේ මතය විචාරපූර්වකව විමසන්න.

3. 'සමාජ ඒකාබද්ධතාව, ආගම සහ සියදිවි නසා ගැනීම වැනි විවිධ සමාජ සංසිද්ධි යම් සමාජයක සමාජ ව්‍යුහය තුළ මුල් බැස ඇති 'සමාජ කරුණු වේ.' යන එමිල් ඩර්කයිම්ගේ අදහස සමග ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

<u>දෙවන කොටස</u>

4. ටැල්කොට් පාසන්ස් ට අනුව 'සමාජ පද්ධතියක් යනු පුද්ගලයන්ගේ ස්වේච්ඡාමය ක්‍රියාවන් මගින් පූරණය කෙරෙන සමාජයේ විවිධ කොටස්වලට අයත් සුවිශේෂ කෘත්‍යයන් ඔස්සේ එම කොටස් අනුකලනයට භාජනය කෙරෙන්නා වූ යම් පැවැත්මකි.' ටැල්කොට් පාසන්ස්ගේ පද්ධති න්‍යාය ඇසුරින් ඉහත ප්‍රකාශය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

අ.පි.බ

5. 'සාංකේතීය අන්තර්ක්‍රියාවාදයේ මූලික ප්‍රස්තුතය වන්නේ මිනිසුන් අතර අන්තර් ක්‍රියාවක් සිදුවෙද්දී, එහි සුවිශේෂ ස්වභාවය, ඔවුන් එකිනෙකාගේ ක්‍රියාවන් නිර්වචනය, විවරණය සහ අර්ථකථනය කරන ආකාරය මත පදනම්ව වටහාගත යුතු බවයි.' මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6. ෆ්‍රෑන්ක්ෆර්ට් ගුරුකුලය මාක්ස්ගේ ද්වන්ද්වාත්මක ක්‍රමය සිය සමාජ චින්තනයේ නිර්යාණ ලක්ෂ්‍යය (පදනම - point of departure) ලෙස සලකමින් සමාජයෙහි ගැබ්වී ඇති ප්‍රතිවිරෝධතා විචාරාත්මකව හඳුනාගනියි. ඔබ තෝරා ගන්නා එක් විවේචනාත්මක න්‍යායවාදියෙකුගේ කෘතීන් ඇසුරෙන් මෙම ප්‍රකාශය විමසන්න.

<u>**තෙවන කොටස**</u>

7. <u>**එක්කෝ**</u>

'ව්‍යුහවාදයේ' මූලික ප්‍රස්තුත පැහැදිලි කර පශ්චාත් ව්‍යුහවාදය මුල්කාලීන ව්‍යුහවාදයෙන් වෙනස් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

<u>**නැතහොත්**</u>

'අප සියලුමදෙනා නිරන්තරයෙන්ම 'සිරගත කරන ලද සමාජය' යනුවෙන් හැඳින්වෙන විවෘත බන්ධනාගාරය තුළ නිරීක්ෂණයට හා පාලනයට ලක් කෙරෙනු ලැබේ යැයි මිෂෙල් ෆූකෝ පවසයි'. මෙම ප්‍රකාශය 'පැනොප්ටිකන්' හා 'ජෛව බලය' යන සංකල්ප ඇසුරෙන් විචාරපූර්වකව සාකච්ඡා කරන්න.

8. <u>**එක්කෝ**</u>

'පරිභෝජනවාදී සමාජය 'අධි යථාර්ථවාදී සංස්කෘතියක්' නිර්මාණය කිරීම මගින් කෘත්‍රිම ආශාවන් තෘප්ත කිරීමට දායකවන අතර සමාජයේ සැබෑ අවශ්‍යතා නොසලකා හරියි.' ජීන් බෝද්‍රිරියාඩ්ගේ තර්ක ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

<u>**නැතහොත්**</u>

පහත දැක්වෙන ඕනෑම මාතෘකා (02) දෙකක් පිළිබඳව කෙටි රචනා ලියන්න.

i. ස්ත්‍රීවාදී න්‍යාය (Feminist Theory)
ii. ප්‍රාචීණවාදය (Orientalism)
iii. නිර්ප්‍රභූ අධ්‍යයන (Subaltern Studies)

*******************

# UNIVERSITY OF COLOMBO – SRI LANKA

## FACULTY OF ARTS

**Examination in Master of Arts in Sociology (Two years) – 2017/2019**
**& Masters in Sociology (One year) – 2017/2018**

**1st Semester**

**MAS 601 – Sociological Theory**

**Answer Four (04) questions only selecting at least one (01) question from each section**

***Time : Three (03) hours only***

---

## SECTION I

1. 'The basis of the moral condemnation of wage labour is not that the wages are too low, but that wage labour by its very nature dehumanizes man.' Examine this statement with reference to Karl Marx's views on the production process in the industrial capitalism.

2. Critically examine Max Weber's idea that all advances of human society are founded upon the basis of 'rationality' that emerged in particular moments of history.

3. Do you agree with the view of Emile Durkheim that diverse social phenomena such as social solidarity, religion and suicides are 'social facts' that are rooted in the social structure of a particular society? Elaborate your answer.

## SECTION II

4. 'A social system according to Talcott Parsons is an entity within which different parts of the society become integrated through their specific functions satisfied by 'voluntaristic' actions of individuals.' Critically discuss the above statement with reference to the systems theory of Talcott Parsons.

P.T.O.

5. 'The basic premise of Symbolic Interactionism is that the society has to be understood in relation to the distinctive character of interaction as it takes place between human beings based on how they define, interpret and attach meanings to each other's actions.' Discuss this statement.

6. 'Frankfurt School takes Marx's dialectical method as the point of departure in their social thought and critically captures the contradictions that are embedded in the society.' Examine this statement with reference to the work of one critical theorist of your choice.

## SECTION III

7. **Either**

Explain the fundamental premises of 'Structuralism' and discuss how post-structuralism differs from early structuralism.

**Or**

Michel Foucault says that we all are always observed and controlled in the open prison known as 'carceral society'. Critically discuss the above statement with reference to the concepts 'panoptican' and bio-power'.

08. **Either**

'The consumer society, by creating a 'hypo-reality culture', caters to satisfy the artificial desires and ignores the real needs of the society'. Discuss the above statement referring to the arguments made by Jean Boudrillard.

**Or**

Write short essays on any **two (02)** of the following topics.

- i Feminist theory
- ii Orientalism
- iii Subaltern studies

********************